**ශීර්ෂය 121 - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය**

**-----------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**--------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------**

ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

**------------------------------------------------------------**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාර්ෂික ඇස්තමේන්තුව අනුව මූලික ආදායම් ඇස්තමේන්තුව රු.190,000,000 ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල ආදායම් ප්‍රකාශයේ මූලික ඇස්තමේන්තුව රු.183,696,500 ක් ලෙස දක්වා තිබුණි. | අයවැය ඇස්තමේන්තු වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල මූලික ඇස්තමේන්තුව ලෙස ගත යුතු වීම. | නිරීක්ෂණ හා එකග නොවෙමි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් ලබා දෙන තොරතුරු පදනම් කර ගෙන සකස් කරන ලද ආදායම් ඇස්තමේන්තුවේ වටිනාකම රු.183,696,500 ක් නමුත් අයවැය දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුවේ මුලු වටිනාකම රු.190,000,000 ක් ලෙස සඳහන් කර තිබුණි. මෙම රු.190,000,000 ක ඇස්තමේන්තු වටිනාකම අයවැය දෙපාර්තමේන්තුවේ අගයක් බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසන් දිනට සේවය හැර ගිය, මියගිය, විශ්‍රාමික, වැඩ තහනම් කළ සහ වෙනත් නිළධාරීන්ගෙන් රු. 3,101,266 ක් වූ අයකර ගත යුතු ණය ශේෂයෙන් වර්ෂ 05 ක් ඉක්මවූ ශේෂය රු. 493,140 ක් විය. | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම ශේෂයන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල 04කට අදාල වන අතර ඒවායින් පිළිතුරු ලැබුනු වහාම ඔබ වෙත ඉදිරිපත් කරන බව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව නිලධාරීන් 03 දෙනෙකුට ආපදා ණය ලබා දී තිබුණු අතර, එයින් 2018 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයවිය යුතු ශේෂය රු. 877,523 ක් විය. | චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව කටයුතු කර ඇති නිලධාරීන් පිළිබඳව විනය පියවර ගැනීමට කටයුතු කළ යුතු වීම. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල නොවන ලෙස ආපදා ණය ලබා දීමට කටයුතු කර ඇති දිස්ත්‍රික් ලේකම් කාර්යාල 03න් පිළිතුරු ලැබුනු වහාම ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

**-----------------------**

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ----------- | ------------------------ |
| (අ) | රු. 5,719,811 ක් වූ තැන්පත් ගිණුම්වල වෙනස් වීම මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් වශයෙන් මුදල් ප්‍රවාහයට නොගෙන මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයෙහි දක්වා තිබුණි. | මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයට තැන්පත් ලැබීම හා ගෙවීම ඇතුළත් කළ යුතු වීම. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් 2018 නොවැම්බර් 21 දින නිකුත් කරනු ලැබූ 267/2018 චක්‍රලේඛය අනුව කටයුතු කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වූ විෂයයන් 6 ක එකතුව රු.48,263,064ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. | හරස් සටහන් මඟින් සිදුකරන මූල්‍යාමය නොවන ගණුදෙනු හැර මුදල්මය ලැබීම් හා ගෙවීම් පමණක් සැලකිල්ලට ගැනීම වෙනසට හේතු වී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගිණුම්ගත විෂයයන් 6 ක එකතුව රු.54,236,487 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව කිරීමට කටයුතු කළ යුතු වීම. | හරස් සටහන් මඟින් සිදුකරන මූල්‍යමය නොවන ගණුදෙනු හැර මුදල්මය ලැබීම් හා ගෙවීම් පමණක් සැලකිල්ලට ගැනීම වෙනසට හේතු වී ඇත. |

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබූ බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | **ඇප ලේඛනය** | | |
| | ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. | නිරික්ෂණය හා එකග වෙමි. අමාත්‍යාංශයේ සියලුම නිළධාරින් වෙත අංක 07/2019 දරන චක්‍රලේඛය නිකුත් කරමින් ඇප මුදල් තැන්පත් කිරිම සම්බන්ධයෙන් විධිවිධාන යොදා ඇත. |
| (ආ) | **හානි පිළිබඳ ලේඛනය** | | |
| | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව නියමිත ආකෘතිය අනුව යාවත්කාලින කර පවත්වාගෙන නොතිබුණි. | නිශ්චිත ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනය පවත්වා ගත යුතු වීම. | නිරික්ෂණය හා එකග වෙමි. නියමිත ආකෘතිය අනුව යාවත්කාලීනව පවත්වාගෙන ගෙන යාමට නිළධාරින් දැනුවත් කර ඇත. |

### 1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | <br>අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| • VIII පරිච්ඡේදය 10 වගන්තිය | අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල අවසාන ගිණුම් පියවීමේ කටයුතු සහ සංවර්ධන කටයුතු වෙනුවෙන් සම්බන්ධ වන මාණ්ඩලික නිලධාරීන් නොවන අනෙකුත් නිලධාරීන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පෞද්ගලික නිර්දේශය මත 1/20 දීමනාවක් ගෙවීමට අනුමත කර තිබුණු අතර, ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල 08 ක රු.1,634,326 ක් ගෙවා තිබුණි . | ආයතන සංග්‍රහයේ විධිවිධානව ලට අනුව කටයුතු කළ යුතු වීම. | මාණ්ඩලික නොවන නිළධාරීන්ගෙන් නිවාඩු දින ලබා ගන්නා රාජකාරි සඳහා ප්‍රතිලාභයක් නොගෙවා සේවය ලබා ගැනීම දුෂ්කර කාර්යයක් බව මාගේ විශ්වාසය වේ. |

| | | | | |
|---|---|---|---|---|
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br>**----------------------** | | | |
| | **(i) මුදල් රෙගුලාසි 104(3) හා 104(4)** | අනතුරු 07 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක පරීක්ෂණ පැවැත්වීම දින 17 සිට මාස 06 දක්වා ප්‍රමාද කර තිබුණු අතර, පූර්ණ වාර්තාවක් යැවීමට මාස 04 සිට වර්ෂයක් දක්වා කාල ප්‍රමාදයක් වී තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිරීක්ෂණ හා එකඟ වෙමි.<br>ඉදිරියේදී මෙය නිවැරදි කිරීම සඳහා නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව කාරුණිකව දන්වමි. |
| | **(ii) මුදල් රෙගුලාසි 104 (2)** | නැතිවීම, පාඩුවීම වටිනාකම රු.50,000 ට වැඩිනම් ඒ වාර්තාවේ පිටපතක් මහා භාණ්ඩාගාරයට යැවිය යුතු නමුත් එකතුව රු. 6,843,433 ක් වූ අනතුරු 06 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | -එම- | නිරීක්ෂණ හා එකඟ වෙමි.<br>එම අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. 104(4) යටතේ අවසන් පරීක්ෂණය අවසන් කර නොමැති අතර අලාභය තක්සේරු කර ගත් වහාම මහා භාණ්ඩාගාර ලේකම් වෙත දැන්වීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. |
| **(ඇ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**<br>**---------------------** | | | |
| | **2018 ජනවාරි 24 දිනැති අංක 02/ 2018 දරන චක්‍රලේඛය** | අමාත්‍යාංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධානව ලට අනුව කටයුතු කළ යුතු වීම | නිරීක්ෂණ හා එකඟ වෙමි.<br>2019 වර්ෂය සඳහා අමාත්‍යාංශය සඳහා පුහුණු සැලැස්මක් සකස් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 ආදායම් කළමනාකරණය

------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් සංකේත අංක 10.03.07.99 සඳහා එකතුව රු. මිලියන 190 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර,රැස් කර තිබූ ආදායම රු.මිලියන 227.9ක් විය. | වාර්ෂික ඇස්තමේන්තු නිවැරදිව සකස් කිරීමට කටයුතු කළ යුතු වීම. | නිරීක්ෂණ හා එකග වෙමි. දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් සේවාලාභීන් වෙත නිකුත් කරන සහතික, බලපත්‍ර පිටපත් සඳහා අයකරනු ලබන ගාස්තු මත පදනම්ව ආදායම් ඇස්තමේන්තු සකස් කරන අතර මෙම ආදායම සේවාලාභී අවශ්‍යතාවය මත පදනම්ව ගණනය වන බැවින් නිවැරදිව පුරෝකථනය කිරීම අපහසු වේ. |

### 2.2 වියදම් කළමනාකරණය

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) අධි ප්‍රතිපාදන සලසා තිබීම** | | |
| **(i)** මූලධන වැය විෂයයන් 13 කට අදාළව මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 11,228.4 ක් වූ අතර, වර්ෂය අවසානයට මුළු වියදම රු.මිලියන 9,102.7 ක් විය. ඉතිරිය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 15 ක සිට සියයට 89 ක් අතර පරාසයක් වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | නිරීක්ෂණ හා එකඟ වෙමි. |

| | | |
|---|---|---|
| **(ii)** පුනරාවර්තන වැය විෂයයන් 14 කට අදාළව මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 140.02 ක් වූ අතර, වර්ෂය අවසානයට මුළු වියදම රු. මිලියන 99.9 ක් විය. ඉතිරිය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 15 ක සිට සියයට 99 ක් අතර පරාසයක් වී තිබුණි. | -එම- | නිරීක්ෂණ හා එකඟ වෙමි. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ------------------------------------------ |
| **(අ)** වැය විෂයයන් 05ක ඉතිරිවීම් ඉක්මවා රු.114,164 ක බැරකම් සඳහා එකඟ වී තිබුණි. | මුදල් රෙගුලාසි 216 (අ) ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | අතිකාල සඳහා දෙසැම්බර් මසට අදාළ වියදම් ප්‍රායෝගිකව නිශ්චිතව ගණනය කර ගැනීමට නොහැකි වීම ප්‍රතිපාදන ඉක්මවා යාමට හේතු වී ඇත. |
| **(ආ)** මූල්‍ය ප්‍රකාශනවල වාර්තා නොකළ රු.349,690 ක් වූ බැරකම් සමාලෝචිත වර්ෂයේ නිරවුල්කර තිබුණි. | 2018 නොවැම්බර් 21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයෙහි 3.4 වගන්තිය අනුව කටයුතු කළ යුතු වීම . | නිරීක්ෂණය හා එකඟ වේ. නිවැරදි ලෙස ඉදිරිපත් නොවීම මත බැඳීම් හා බැරකම් වාර්තාවන්ට ඇතුළත් කර නොතිබුණි. |

**2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, කාර්යය නිම වී දින 10ක් ඇතුළත පියවිය යුතුව තිබුණද, නිකුත් කර තිබුණු එකතුව රු.2,405,151 ක තත්කාර්යය අතුරු අග්‍රිම දින 3ක සිට දින 179ක් දක්වා කාල ප්‍රමාදයකින් පසු පියවා තිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. | නිරීක්ෂණ හා එකඟ වෙමි. මින් ඉදිරියට එම චක්‍රලේඛයට පරිබාහිරව කටයුතු කරන නිලධාරීන්ට අදාල කාලය තුල පියවා නැත්නම් ඔවුන්ගේ මාසික වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැඩි දියුණු කිරීමට අපේක්ෂිත සංචාරක බංගලා සංඛ්‍යාව සඳහන් නොකර රු. මිලියන 50 ක් වෙන් කරගෙන තිබුණි. ඉන් රු. මිලියන 8.9 ක් පමණක් වැයකර සංචාරක බංගලා 12 ක් වැඩිදියුණු කර තිබුණි. | සැලැසුම් කළ පරිදි කටයුතු කළ යුතු වීම. | අලුත්වැඩියා කටයුතු සඳහා ඉල්ලීම් ඉදිරිපත් කරන ලද සංචාරක නිවාස සඳහා පමණක් 2018 වර්ෂයේදී රු.මිලියන 8.9ක ප්‍රතිපාදන ලබා දී ඇත. |

| | | |
|---|---|---|
| (ආ) කාර්ය මණ්ඩලය පුහුණුව සැලැසුම් කළ සඳහා රු. මිලියන 50 ක් වෙන්කර තිබුණු අතර ඉන් රු. මිලියන 21 ක් වැයකර පුහුණු වැඩසටහන් 35 ක් පමණක් පවත්වා සියයට 42 ක ඉලක්කයක් ලඟාකරගෙන තිබුණි. | පරිදි කටයුතු කළ යුතු වීම. | නිරීක්ෂණ හා එකග වෙමි. ස්වදේශ කටයුතු අංශයේ සියලුම නිලධාරීන් ආවරණය වන පරිදි පුහුණු සැලැස්මක් සකස් කරන ලද අතර විවිධ හේතූන් මත සංවිධානය කළ සියලු වැඩසටහන් පැවැත්වීමට නොහැකි වී ඇත. |

### 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ------------------------------- |
| කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිලි සංකීර්ණය - **III** අදියර ඉදිකිරීම සඳහා 2016 ජුනි 30 දින ගිවිසුම්ගත වී තිබුණු අතර, දින 1,095 ක් තුළ ඉදිකිරීම් නිම කළ යුතු විය. ඉදිකිරීම් කටයුතු කඩිනම් කර 2017 දෙසැම්බර් 20 දින වැඩ අවසන් කිරීම සඳහා 2017 මාර්තු 28 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලබාගෙන තිබුණි. එසේ වුවද 2019 මැයි වනවිටත් ඉදිකිරීම් කටයුතු නිම කර නොතිබුණි. කරුණු එසේ හෙයින් 2018 වර්ෂයේ දී ගොඩනැගිලි කුලී රු.මිලියන 29.55ක් ගෙවා තිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | සංවර්ධන අංශයෙන් පිළිතුරු ලද විගස ඔබ වෙත ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**3.3 විදේශ ආධාර ව්‍යාපෘති**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------ | ---------------------------------------- |
| (අ) | විදුලි උත්පාදක යන්ත්‍ර 111 ක් රු. 4,995,000 කට මිලදී ගෙන යන්ත්‍ර 95 ක් ප්‍රදේශීය ලේකම් කාර්යාල 11 ක් හා වෙනත් ආයතන 04 ක් වෙත බෙදාදී තිබුණි. එසේ වුවද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ඇති යන්ත්‍ර 16 ක් මිලදී ගත් දින සිට කිසිදු ප්‍රයෝජනයකින් තොරව තබා තිබුණි. | විදේශාධාර ව්‍යාපෘතිවලින් ලැබෙන මුදල් ආර්ථිකභාවයෙන්, කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතු වීම. | විදුලි උත්පාදක යන්ත්‍ර 111 ක් මිලදි ගත් අතර එයින් එක් කොට්ඨාසයකට විදුලි උත්පාදක යන්ත්‍ර 09 බැගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 වෙත බෙදාදීමටත් ඉතිරි 12 දිස්ත්‍රික්කයේ හදිසි ආපදා අවස්ථාවන්හි ප්‍රයෝජනය ගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගබඩාවේ තබා ගැනීමටත් තීරණය කරන ලදී. |
| (ආ) | කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් රු.1,044,423 ක්වූ ආධාර මුදල් උපයෝජනය කිරීමකින් තොරව භාණ්ඩාගාරය වෙත ආපසු යවා තිබුණි. | -එම- | කෑ/දෙහි වෙලන්ගල්ල කනිෂ්ඨ විද්‍යාල භූමියෙහි හදිසි ආපදා අවස්ථාවකදි ප්‍රයෝජනයට ගැනීම සඳහා ඉදිකරන ලද ගොඩනැගිල්ල සහ වැසිකිළි පද්ධතිය ඉදිකිරීමට අදාළව රු. මිලියන 05ක් වෙන් වී තිබූ අතර එයින් රු. මිලියන 1.04 ක් ඉතිරි වී ඇත. |

## 3.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 වර්ෂයේදී පරීක්ෂණ ආරම්භ කර ඇති වාහන අනතුරු 22ක් සහ 2018 වර්ෂයේ සිදුවූ වාහන අනතුරු 04ක් සම්බන්ධ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | නිරීක්ෂණ හා එකග වෙමි. 2015, 2017 සහ 2018 වර්ෂවලදී සිදු වූ අනතුරු අතරින් පොතෙන් කපා හැරීම සඳහා වන අනතුරු 3ක් පවතින අතර එම අනතුරු සම්බන්ධයෙන් සම්පූර්ණ කරන ලද මු.රෙ.109 ආකෘති පත්‍ර සම්පූර්ණ කර ඇතුළත් කළ බව කාරුණිකව දන්වා සිටිමි. |

## 3.5 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | වාහන අනතුරු අලුත්වැඩියා අවස්ථා 03 ක දී "රක්ෂණ ආයතනය අනුමත කරන මුදලට යටත්ව" වශයෙන් අළුත්වැඩියාව සිදුකරන ආයතනයට කොන්දේසියක් ඇතුළත් කිරීම තුළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1.(අ) හා 1.2.1.(ඇ) විධිවිධානයන්ට අනුකූල නොවීමක් නිරීක්ෂණය විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතු වීම. | පිළිගනිමි. ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1951 අංක 14 දරන මෝටර් වාහන ආඥාපනතේ 151(2) හා 151(3) වගන්තිය අනුව අපරික්ෂාකාරී හා අධික වේගයෙන් වාහනය ධාවනය නොකළ යුතු බව දක්වා ඇති නමුත්, අවස්ථා 02 කදී රියදුරු විසින් ඒ අනුව කටයුතු කර නොතිබීම හේතුවෙන් රු. 4,849,189 ක අලාභයක් සිදුවී තිබුණි. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. | පිළිගනිමි. ඉදිරියේදී මෙවැනි දේ සිදු නොවීමට රියදුරන් වෙත උපදෙස් ලබා දී ඇත. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර අමාත්‍යාංශය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වූ ආකාරය සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | දිස්ත්‍රික් පාලන අංශය මගින් පිළිතුරු ලද විගස ඔබ වෙත ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 389 ක් වූ අතර තථ්‍ය කාර්ය මණ්ඩලය 314 ක් විය. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 83 ක් වූ අතර ද්විතියික මට්ටමේ නිලධාරීන් 08 ක අතිරික්තයක්ද නිරීක්ෂණය විය. | පුරප්පාඩු පිරවීම හා අතිරික්ත සංඛ්‍යාව අවශ්‍යතාව අනුව සලකා බලා කාර්ය මණ්ඩලයට ඇතුළත් කළ යුතු වීම. | නිරීක්ෂණ හා එකග වෙමි. |